# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි

## භාවිත කළ වාහන 01 ක් විකිණීම - 2025

### කොන්ත්‍රාත් අංකය : UGC/Admn/12

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි වාහන 01 ක් විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| වාහන අංකය | වර්ගය | මාදිලිය | එන්ජින් ධාරිතාවය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| KQ-5408 | ටොයොටා | ලෑන්ඩ් කෲෂර් | 4461.00 CC | 01 |

02. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සාමාන්‍ය පරිපාලන (දුරකථන අංකය : 0112685183) වෙතින් ලබාගත හැකි අතර, 2025 මාර්තු 12 වන දින සිට 2025 මාර්තු 25 වන දින දක්වා වැඩකරන දිනයන්හිදී පෙ.ව.9.00 සිට ප.ව. 3.00 අතරතුර කාලයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේදී වාහනය පරීක්ෂා කොට බැලිය හැක.

03. ආපසු ගෙවනු නොලබන ගාස්තු රු. 5,000.00 (රුපියල් පන්දහසක්) ගෙවීමෙන් ලද බිල ලදුපත සමග ලිඛිත ඉල්ලීමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සාමාන්‍ය පරිපාලන වෙත ඉදිරිපත් කිරීමෙන් 2025 මාර්තු 12 වන දින සිට 2025 මාර්තු 25 වන දින දක්වා වැඩකරන දිනයන්හිදී පෙ.ව.9.00 සහ ප.ව. 3.00 අතරතුරු කාලයේදී අභිලාෂී ලංසුකරුවන්ට ලංසු ලිපිලේඛන මිලදී ගත හැක. ගෙවීම් මුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත කළ යුතුය.

04. සියලුම ලංසු සමග ලංසු අවසන් කරන දිනයේ සිට දින 90 ක් වලංගු රු. 100,000.00 (රුපියල් ලක්ෂයක්) ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. නැතහොත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත මුදලින් ගෙවිය යුතුය.

05. යථා පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලිපි ලේඛන පිටපතක් සහිතව, වෙන් වෙන්ව කවර දෙකක බහා මුද්‍රා තබා **"මුල් පිටපත"** සහ **"අනු පිටපත"** ලෙස සලකුණු කොට නැවත එම කවර දෙකම වඩා ලොකු කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි **"භාවිත කළ වාහන 01 ක් විකිණීම - 2025"** ලෙස සටහන් කොට 2025 මාර්තු 25 වන දින ප.ව. 3.00 ට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම සිදුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2025 මාර්තු 25 වන දින ප.ව. 3.00 ට පහත සඳහන් ලිපිනයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ. ලංසු සම්බන්ධයෙන් තැපෑලේදී හෝ වෙනත් ආකාරයකින් සිදුවන යම් ප්‍රමාදයක් හෝ අස්ථානගත වීමක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කිසිදු වගකීමක් නොදරයි.

07. ලංසුව පිළිගැනීම ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, සාර්ථක ලංසුකරු දින 03 ක් ඇතුළත ලංසු මුදල ගෙවිය යුතු අතර, ලංසුව පිරිනමා දින 07 ක් ඇතුළත වාහනය ඉවත් කරගත යුතුය. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

08. තෝරාගත් ලංසුකරු නියමිත දින හෝ ඊට පෙර ගෙවිය යුතු මුදල නොගෙවන්නේ නම් ඔහුගේ ලංසුව ප්‍රතික්ෂේප වන අතර, ඊළඟ ඉහළම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ලංසුව පිරිනැමේ.

09. ලංසු ආරාධනාවෙහි 8 වන වගන්තියට අනුව ලංසුව ප්‍රතික්ෂේප වන්නේ නම් එවැනි ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අහිමි කරනු ලැබේ.

10. ලංසු 2025 ජූනි 24 වන දින දක්වා වලංගු විය යුතුය.

11. මෙහි දක්වා ඇති උපදෙස් සහ කොන්දේසි වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**2025 මාර්තු 12 වන දින.**